**ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොඩුවාමඩු සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ වෙනත් ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහනගර සභා විසින් බැහැර කරනු ලබන සන අපද්‍රව්‍ය මගින් ලැබී තිබූ සමාලෝචිත වර්ෂයේ ආදායම රු.8,147,610ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු.7,417,710ක්ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ද්‍රව්‍ය බැහැර කිරීමෙන් ලැබිය යුතු රු.2,258,283ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට පියවර ගෙන ඇති බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ,ගනුදෙනුවලින් අලාභයක් සිදු වී නොතිබුණද එය රු.1,666,720 ක අලාභයක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | ඉදිරි කාලයේදී උපචිත පදනමින් ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කරන බව. | ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී සභාවට ලැබුණු රු.556,106ක් වටිනා පොත් 2,007ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මෙම වටිනාකම ගිණුම්වල අනාවරණය කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල පොත්වල වටිනාකම වත්කම් ලෙස දැක්විය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.262,030 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | වර්ෂයට නියමිත නිවැරදි ආදායම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඊ) | සභාවේ අනුමැතියකින් තොරව ඉදිකළ ගොඩනැගිලි සඳහා අයකළ යුතු දඩගාස්තු රු.121,037ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මෙම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දඩගාස්තු වත්කම් ලෙස දැක්විය යුතුය. |
| (උ) | පුද්ගලික දුරකථන සමාගම් විසින් සභා බලප්‍රදේශයේ ඉදිකර තිබූ දුරකථන සන්නිවේදන කුළුණු සඳහා අයකළ යුතු හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු රු.102,000ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | හිඟ ආදායම් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දැක්විය යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ අවසාන කාබනික පොහොර තොග කිලෝ ග්‍රෑම් 172හි පිරිවැය රු.51,200 මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | අවසන් තොගය ගිණුම්වල වත්කමක් ලෙස දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට සභාව විසින් ගෙවිය යුතු ජල ගාස්තු රු.30,562ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | හිඟහිටි ජල ගාස්තුවල ආසන්නතම වටිනාකම අපට ගතනොහැකි බව. | ගෙවිය යුතු හිඟ හිටි ගිණුම්වල බැරකමක් ලෙස දැක්විය යුතුය. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.146,185,023 ක් වටිනා ගිණුම් ශේෂ 03 ක් හිමිකම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන සහ වෙනත් සනාථ කිරීම් ලියවිලි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | හිමිකාරිත්වය තහවුරු කිරීමේ ලිපිලේඛන සහ ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන යාමට පියවර ගෙන ඇත. | වත්කම්වලට අදාල ලිපිලේඛන රැස්කර ලෙජරයේ ඇතුළත් කිරීමට පියවර ගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය සහ මඩකලපුව දිස්ත්‍රික් පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2013 ජූලි 10 දිනැති අංක BT/ACLG/PL/Road/2013 දරන ලිපිය | සභාව සතු මාර්ග ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර නොතිබුණි. | සියළුම මාර්ග ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | මාර්ග ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කිරිමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ආ)** | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පාලන) රීති III පරිච්ඡේදයේ 59 වගන්තිය | ප්‍රදේශීය සභා පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව, සභා බලප්‍රදේශයේ පිහිටි වෙළෙඳාම් පිළිබඳ සමීක්ෂණ වාර්තාවක් ආදායම් පරීක්ෂකවරයා විසින් සකස් කර සමාලෝචිත වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | ව්‍යාපාර පිළිබඳ න්‍යාය පත්‍රයක් සකස් කර මාර්තු 31 දිනට ප්‍රථම ඉදිරිපත් කරන ලෙසට ආදායම් පරීක්ෂකවරුන්ට වර්තමානයේ උපදෙස් ලබා දී ඇති බව. | රීති ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු රෙ 371(2)(ආ) | සභාව විසින් පසුගිය සහ සමාලෝචිත වර්ෂයේ ලබා දුන් තත්කාර්ය අත්තිකාරම් රු.6,682,760ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | අත්තිකාරම් නිරවුල් කිරීමට පියවර ගන්නා බව. | අත්තිකාරම් ගෙවීම් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 571(1) හා (2) | කල් ඉකුත් වූ තැන්පතු රු.16,907,166ක් නියාදනය කර නොතිබුණි. | වර්ෂ 02ක් ඉක්ම වූ තැන්පතු අදාල පුද්ගලයින්ට ලිඛිතව දන්වා ඉන් පසුව ආදායමට මාරු කිරීමට කටයුතු කරන බව. | තැන්පතු නිරවුල් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 97,152,572 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 83,880,400 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i) | වරිපනම් හා බදු | 2,004,500 | -- | -- | 992,082 | 2,152,000 | -- | -- | 992,082 |
| ii) | කුලී | 15,370,000 | 11,457,854 | 14,607,772 | 5,484,204 | 16,445,000 | 8,601,686 | 4,848,540 | 8,634,122 |
| iii) | බලපත්‍ර ගාස්තු | 3,726,000 | 3,089,967 | 3,089,967 | -- | 3,526,000 | 2,950,718 | 2,950,718 | -- |
| iv) | වෙනත් ආදායම් | 50,712,000 | 57,159,616 | 58,159,616 | 2,609,529 | 51,047,000 | 17,510,494 | 13,900,966 | 3,609,529 |
| | | 71,812,500 | 71,707,437 | 75,857,355 | 9,085,815 | 73,170,000 | 29,062,898 | 21,700,224 | 13,235,733 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියළුම ආදායම් රැස්කිරීම්වල කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී** | | |
| | දීර්ඝකාලීන බදු ලෙස කඩකාමර ලබා ගත් බදුකරුවන් 06 කගෙන් හිඟ හිටි බදු කුලී රු.259,000 ක් අය කිරීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | බදු කුලී හිමියන්ගෙන් හිඟ මුදල් අයකිරීමට ලිඛිතව දැනුම්දීම් සිදු කර ඇති බව. | හිඟ බදු කුලී අය කිරිමට පියවර ගත යුතුය. |
| (ආ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | පුද්ගලික දුරකථන සමාගම් විසින් සභා බලප්‍රදේශයේ ස්ථාපිත කර ඇති දුරකථන සන්නිවේදන කුළුණු සඳහා අයකළ යුතු වෙළෙඳ බලපත්‍ර ගාස්තු රු.108,000ක් විගණන දිනය වන විටත් අය කිරිමට පියවර ගෙන නොතිබුණි. | අය කළ යුතු බලපත්‍ර ගාස්තු පිළිබඳව ලිඛිතව අදාල සමාගම් වෙත දැනුම් දී ඇති බව. | ව්‍යාපරික ස්ථානවලට වෙළෙඳ බලපත්‍ර නිකුත් කර බලපත්‍ර ගාස්තු අයකර ගත යුතුය. |
| (ඇ) | **මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.37,233,863 ක් විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බැංකු ජංගම ගිණුමේ සෑම මාසයක් අවසාන දිනට රු.මිලියන 50 සිට 77ක් අතර ප්‍රමාණයක අතැති මුදල් ශේෂ පැවැති අතර එම මුදල් බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර පොලී ආදායම් ඉපැයීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ආයෝජනවලින් ආදායම් ඉපැයීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1992 සැප්තැම්බර් 30 දිනැති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශයට පත්කළ අංක 1769 දරන පොදු චක්‍රලේඛය ප්‍රකාරව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට තනි මහලක් සඳහා පමණක් සැලැසුම් ඇඳිය හැකි වුවත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් සකස් කළ දෙමහල් ගෘහ නිර්මාණ සැලැසුම් 48 ක් සභාව අනුමත කර තිබුණි. | ඉදිරි කාලයේදී මෙවැනි දෝෂ සිදු නොවන බව. | චක්‍රලේඛය අනුව ගෘහ නිර්මාණ සැලැසුම් අනුමත කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ප්‍රජා මූල මධ්‍යස්ථාන 16 ක එකතුව රු.5,881,787ක මුදල් ශේෂයක් ඉතුරුම් ගිණුම්වල පැවති නමුත් එම මුදල් ඵලදායී ලෙස යොදා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ස්ථාවර තැන්පතුවල තැන්පත් කිරීමට පියවර ගන්නා බව. | මූල මධ්‍යස්ථානවල රැඳී තිබෙන අරමුදල් පිළිබඳව ඉහළ අවධානයක් යොමු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 සහ 2021 යන වර්ෂවල සභාවට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් විවිධ වූ ස්ථාවර වත්කම් 10ක් පරිත්‍යාග ලෙස ලැබී තිබූ නමුත් එහි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී දක්වන බව. | පරිත්‍යාග වශයෙන් ලැබූ තිබූ වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් සවුක්කඩි ගම්මානයේ පිහිටි වෙරළ උද්‍යාන විවේකාගාරය, සිත්තාන්ඩි ගම්මානයේ පිහිටි පොදු වෙළෙඳපොල කඩකාමර, චෙන්කලාඩි පැරණි වෙළෙඳපොල කඩකාමර - කඩකාමර 04ක්, චෙන්කලාඩි නව වෙළෙඳපොල කඩකාමර - කඩකාමර 10ක්, බස්නැවතුම්පළ කඩකාමර, සිත්තාන්ඩි වෙළෙඳපොල කඩකාමර, කිතුල් වෙළෙඳපොල කඩකාමර- කඩකාමර 04ක් ආදි දේපළ ආදායම් ඉපැයීමට භාවිතා කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ආදායම් ඉපැයීමට පියවර ගත යුතුය. |
| (ආ) | වෙනත් රාජ්‍ය ආයතනවලින් පරිත්‍යාග ලැබූ වාහන, ට්‍රේලර් සහ බවුසර් ඇතුළුව වාහන 19 ක් සභාව විසින් පරිහරණය කර තිබූ නමුත්, ඒවා සභාවේ නමට හිමිකාරිත්වය මාරුකිරීමට පියවර ගෙන නොතිබුණි. | -එම- | වාහනවල හිමිකාරිත්වය මාරු කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | සභාවේ දෝෂයට ලක්ව පවතින වාහන 13ක්, අළුත්වැඩියා කිරීමට පසුගිය වර්ෂ 03ක සිට කටයුතු කර නොතිබුණි. | -එම- | වාහන අළුත්වැඩියා කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 12ක ලියාපදිංචි පොත් ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි. | -එම- | වාහනවල හිමිකාරිත්වය මාරු කිරීමට පියවර ගත යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන විශේෂ ව්‍යාපෘතියේ (**LDSP-PT** 1st 50%) 01වැනි අදියර යටතේ රු.මිලියන 03 ක මූල්‍ය ප්‍රතිපාදනයෙන් කාර්යාල ගොඩනැගිල්ලට 18**kw** ක සූර්ය විදුලි උත්පාදන පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා පුවත් පත් දැන්වීම් සඳහා රු.105,572ක් ගෙවීම් සිදුකර තිබූ නමුත් එම ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | එක් ලංසුකරුවකු පමණක් ලංසු ලේඛන ලබාගෙන තිබූ නමුත් එය ඉදිරිපත් කර නොතිබුණි. එමනිසා, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණු බව. | ව්‍යාපෘති නියමිත කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු සහ අතිරික්ත** | | |
| | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්ය මණ්ඩල ලැයිස්තු ප්‍රකාරව සභාවේ පැවැති තනතුරු 12ක් සඳහා පුරප්පාඩු 19ක් සහ අතිරික්තව සේවකයින් 01ක් විය. | කාර්ය මණ්ඩලය පිළිබඳව සභාව විසින් අවධානය යොමු කර ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | පුරප්පාඩු පිරවීමට සහ අතිරික්ත සේවකයින් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමර්ග ගැනීමත් සිදු කළ යුතුය. |
| (ආ) | **සේවක ණය** | | |
| | විශ්‍රාම ගිය, සේවයෙන් ඉවත්වූ සහ ස්ථානමාරුවීම් ලැබී ගිය සේවකයින් 03කගෙන් අයකළ යුතු ණය ශේෂ එකතුව රු.117,131ක් අදාල පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකිරීමට සභාව විසින වර්ෂ 05ක සිට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සේවකයින්ගෙන් අයකළ යුතු ණය ශේෂ අයකිරීමට ලිඛිතව දැනුම්දීමට නියමිත බව. | හිඟ සේවක ණය අය කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රයේ 08 වගන්තිය ප්‍රකාරව, පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPL) කල් ඉකුත් වීමට මාස 03කට ප්‍රථම අළුත්කිරිමට ඉල්ලුම් කළ යුතුය. එසේ වුවත්, ආයතන 79ක බලපත්‍ර කල් ඉකුත්වී තිබූ නමුත් අළුත්කිරිමට පියවර ගෙන නොතිබුණි. | ඉදිරියේදි මෙලෙස සිදුනොවීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත්කිරිමට සහ කල්ඉකුත් වීම සම්බන්ධයෙන් දැනුම් දීමටත් පියවර ගත යුතුය. |